Sri Lanka POST
ශ්‍රී ලංකා තැපැල් · இலங்கை அஞ்சல்

තැපැල් දෙපාර්තමේන්තුව
அஞ்சல் திணைக்களம்
Department of Post

තැපැල් මූලස්ථානය, 310 ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 01000
அஞ்சல் தலைமையகம், 310, டீ.ஆர். விஜேவர்த்தன மாவத்தை, கொழும்பு 01000
Postal Headquaters, 310, D.R. Wijewardana Mawatha, Colombo 01000

මගේ අංකය
எனது இலக்கம்
My No. PMG/PA/MISC/47/2020

ඔබේ අංකය
உமது இலக்கம்
Your No.

දිනය
திகதி
Date 2020.03.28

සියළුම නියෝජ්‍ය තැපැල්පතිවරුන්,
සියළුම ප්‍රාදේශීය තැපැල් අධිකාරිවරුන්,

**කොරෝනා වසංගතය මැඩපැවැත්වීම සඳහා පනවා ඇති ඇඳිරිනීති කාලය තුල දී, රජයේ සායනවල ලියාපදිංචි රෝගීන් සඳහා ඖෂධ තැපැල්කරු මහතුන් මගින් නිවෙස් වෙත බෙදා හැරීම**

කොරෝනා වසංගතය මැඩපැවැත්වීම සඳහා පනවා ඇති ඇඳිරිනීති කාලය තුල දී, රජයේ සායනවල ලියාපදිංචි රෝගීන් සඳහා ඖෂධ, තැපැල්කරු මහතුන් මගින් නිවෙස් වෙත බෙදා හැරීම සිදුකිරීමට තැපැල් දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. ඒ අනුව නියෝජ්‍ය තැපැල්පති සහ ප්‍රාදේශීය තැපැල් අධිකාරිගේ අධීක්ෂණය යටතේ තැපැල් ස්ථානාධිපතිගේ මෙහෙයවීම මගින් අවස්ථාවෝචිත පරිදි තැපැල්කරු මහතුන් හා ලියාපදිංචි ආදේශක මහතුන් යොදවාගෙන මෙම කටයුතු සිදුකල යුතුය.

ඒ අනුව නියමිත සායනවලට සහභාගී වීමට නොහැකි වන රෝගීන් සඳහා රෝහල් ප්‍රධානීන් විසින් ලබා දෙන බෙහෙත් වට්ටෝරු අනුව ඇසුරුම් කරන ලද බෙහෙත් අඩංගු පැකට්ටු රෝහල් වෙතින් ප්‍රාදේශීය තැපැල් අධිකාරි හෝ තැපැල් ස්ථානාධිපති විසින් නිතිපතා එකතු කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. ඒ සඳහා එක් එක් බෙදීම් සීමාවල්වල පවතින කාර්යාල හා රෝහල් අතර ඇති දුර අනුව සුදුසු පරිදි ක්‍රමවේදයක් සකසා ගැනීමට ප්‍රාදේශීය තැපැල් අධිකාරි කටයුතු කල යුතුය. මේ සඳහා ප්‍රාදේශීය තැපැල් අධිකාරි නිල රථයට අවශ්‍ය වන ඉන්ධන සඳහා ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් සහ දිසා ගණකාධිකාරී වෙත ලබාදී ඇති ඉන්ධන ප්‍රතිපාදනයන් ද භාවිතා කල හැකි බව දන්වා සිටිමි. මෙහිදී ධාවනය කරන ලද සියලුම දුර ප්‍රමාණයන් හා ස්ථාන ධාවන සටහන් පොතෙහි ඇතුලත් කර නිසි පරිදි පවත්වාගෙන යායුතු බව අවධාරණය කරමි. එමෙන්ම මේ සඳහා අවශ්‍යතාවය පරිදි පෞද්ගලික මෝටර් බයිසිකල්ද භාවිතා කල හැකිය. එහිදී ප්‍රාදේශීය තැපැල් අධිකාරි විසින් සුදුසු පරිදි ඉන්ධන ප්‍රතිපූරණයන් ලබා දීමට කටයුතු කල යුතුය

බෙදාහැරීමේදී නිවැරදි පුද්ගලයාවම හඳුනාගැනීම අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතුය. මෙහිදී ලිපිනය වෙත ලබා දීම පමණක් නොව නිවැරදි පුද්ගලයාටම භාරදීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුය. නිවැරදි පුද්ගලයාට බෙදීම් සිදු කළේද යන්න තහවුරු කරගනිමින් ඖෂධ ලබා දුන් බවට ඖෂධ ලබා දුන් තැනැත්තාගේ නම දිනය සහ වේලාව සටහන් කර තබා ගත යුතුය. (අදාල නොවන පුද්ගලයකු අතට මෙම ඖෂධ පැකට්ටු ලබා දීම කිසිසේත් නොකල යුතු බව තරයේ දන්වා සිටිමි.) තවද පැකට්ටුවේ රෝගියාගේ නම සහ ලිපිනයට අමතරව දුරකතන අංකය සඳහන් වී තිබෙන බැවින් ලිපිනය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී දුරකථන ඇමතුමක් මගින් විමසීම් කර බෙදීම් කිරිමට කටයුතු කළ යුතුය.

එමෙන්ම කිසියම් කෙනෙක් මෙම ඖෂධ පැකට්ටු ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහු වෙත බලහත්කාරයෙන් ලබාදීම නොකළ යුතු අතර එසේ ප්‍රතික්ෂේප වන ඖෂධ පැකට්ටු හා බෙදීමට නොහැකි වන ඖෂධ පැකට්ටු නැවත රෝහල වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

තවද ඇඳිරිනීතිය පනවා ඇති කාල සීමාව තුලදී බෙදීම් සිදු කිරීමේදී තැපැල්කරු මහතුන් තම නිල ඇඳුම හා රාජකාරී හැඳුනුම්පත පැලද සිටිය යුතු අතර ආසන්නම පොලිස් ස්ථානයෙන් ඇඳිරිනීති බලපත්‍රයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

බෙදීම් කටයුතු සිදු කරන අවස්ථා වලදී අවශ්‍ය මුඛ ආවරණ හා අත්වැසුම් (gloves) ඒ ඒ රෝහල් වලින් ඖෂධ ලබා දෙන අවස්ථා වලදීම සැපයීම් කරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා එකග වූ බවද දන්වා සිටිමි.

මේ අවස්ථාවේ රටේ පවතින තත්ත්වය හමුවේ සියලුම දෙනා මෙම කාර්යය සත්භාවයෙන් හා ඉතාමත් වගකීමෙන් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි. එමෙන්ම සියලුම සේවක මහත්ම මහත්මීන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් මේ අවස්ථාවේ සේවයේ යොදවා ගැනීම් සිදු කරන ලෙසද, සියලුම දෙනා තමන්ගේ මෙන්ම අන් අයගේ ආරක්ෂාව තහවුරු වන අයුරින් කටයුතු කරන ලෙසද තවදුරටත් දන්වා සිටිමි.

රංජිත් ආරියරත්න
තැපැල්පති

1. තොරතුරු හා ජනමාධ්‍ය
   ගරු අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමා - කාරුණික දැනගැනීම සඳහා

2. අත්‍යාවශ්‍ය සේවාවන් පිළිබඳ ජනාධිපති කාර්යය සාධක බලකා
   ප්‍රධානී බැසිල් රාජපක්ෂ මැතිතුමා - කාරුණික දැනගැනීම සඳහා

3. තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්
   චූලානන්ද පෙරේරා මහතා -කාරුණික දැනගැනීම සඳහා

4. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හද්‍රානි ජයවර්ධන මහත්මිය - කාරුණික දැනගැනීම සඳහා

5. වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද හමුදාපති
   ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා - කාරුණික දැනගැනීම සඳහා

6. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය
   අනිල් ජාසිංහ මහතා - කාරුණික දැනගැනීම සඳහා

**රංජිත් ආරියරත්න**
**තැපැල්පති**